AL/2020/54/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 6 | |
| 02 | 7 - 13 | |
| 03 | 14 - 21 | |
| 04 | 22 - 30 | |
| 05 | 31 - 40 | |
| 06 | 41 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** මෝගල් යුගයට පෙර සිට ම පැවතෙන, පැරණිත ම ගායන ශෛලිය කුමක්ද?
(1) ඛ්‍යාල් (2) තරාණා (3) ධෘපද් (4) ගැසල් (5) චතුරංග (……)

**2.** පහත දැක්වෙන රාග යුගල අතුරෙන් උත්තරාංගවාදී රාග යුගලය තෝරන්න.
(1) ආසාවරී සහ ජයජයවන්ති (2) ආසාවරී සහ භෛරව (3) දේස් සහ බාගේශ්‍රී
(4) කාලිංගඩා සහ ජයජයවන්ති (5) හංසධ්වනි සහ තිලක්කාමෝද් (……)

**3.** 'ත්‍රිතාල්' සහ 'තිලවඩා' යන තාල දෙකෙහි ම
(1) ලය සමාන වේ. (2) ඨේකා සමාන වේ.
(3) මාත්‍රා සංඛ්‍යා සමාන වේ. (4) විභාග සංඛ්‍යා අසමාන වේ.
(5) තාල ස්ථාන අසමාන වේ. (……)

**4.** ගානසම නියමය අනුව, පූර්වරාග ගායනා කරනු ලබන්නේ,
(1) උදේ 6 සිට සවස 6 දක්වා කාලය තුළ ය.
(2) සවස 6 සිට උදේ 6 දක්වා කාලය තුළ ය.
(3) උදේ 6 සිට මධ්‍යාහ්න 12 දක්වා කාලය තුළ ය.
(4) මධ්‍යම රාත්‍රී 12 සිට මධ්‍යාහ්න 12 දක්වා කාලය තුළ ය.
(5) මධ්‍යාහ්න 12 සිට මධ්‍යම රාත්‍රී 12 දක්වා කාලය තුළ ය. (……)

**5.** ඛ්‍යාල් ගායනයේ දී යොදා **නොගැනෙන** ආලාප විශේෂය කුමක් ද?
(1) බෝල් ආලාප (2) අකාර් කී ආලාප (3) පූර්ව ආලාප
(4) සර්ගම් කී ආලාප (5) ජෝඩ් ආලාප (……)

**6.** රාගධාරී වාදනයේ දී යොදා ගත **නොහැකි** තානාලංකාර විශේෂය තෝරන්න.
(1) ශුද්ධ තාන (2) බෝල් තාන (3) කූට තාන (4) මිශ්‍ර තාන (5) අලංකාරික තාන (……)

[දෙවැනි පිටුව බලන්න.

7. ඒක්තාල් සහ චෞතාල් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) තාල දෙකෙහි ම විවෘත අක්ෂර යොදා ගැනේ.
   (2) තාල දෙක ම ඛ්‍යාල් ගායනය සඳහා යොදා ගැනේ.
   (3) තාල දෙක ම පඛාවාජයෙන් පමණක් වාදනය කෙරේ.
   (4) තාල දෙකෙහි ම තාල ස්ථාන (තාලි-ඛාලි) සමානව යෙදේ.
   (5) තාල දෙකෙහි ම මාත්‍රා සංඛ්‍යා එකිනෙකට වෙනස් ය. (……)

- අංක **8** සිට **10** තෙක් ප්‍රශ්න සඳහා, පහත ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| (ම) ප | නිස් රිගු රිස් | ^පනි ධ | පම ගරි ගස |
| x | 2 | 0 | 3 |

8. ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය සහ තාලය පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
   (1) බාගේශ්‍රී - ජප්තාල්
   (2) දේස් - ජප්තාල්
   (3) ජයජයවන්ති - ඒක්තාල්
   (4) බාගේශ්‍රී - ඒක්තාල්
   (5) දේස් - දීප්චන්දි (……)

9. නියමිත රාගයට අදාළ ව ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිඹිබු වන 'කන් ස්වරය' සහ 'වක්‍ර ස්වරය' පිළිවෙළින්,
   (1) මධ්‍යමය සහ පංචමය වේ.
   (2) කෝමල ගාන්ධාරය සහ කෝමල නිෂාදය වේ.
   (3) රිෂභය සහ කෝමල ගාන්ධාරය වේ.
   (4) පංචමය සහ රිෂභය වේ.
   (5) කෝමල නිෂාදය සහ රිෂභය වේ. (……)

10. ප්‍රස්තාරයෙන් පිළිඹිබු වන රාගයෙහි යෙදෙන, 'විවාදි ස්වරය' සහ 'රාග ජාතිය' නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
   (1) කෝමල නිෂාදය සහ සම්පූර්ණ
   (2) කෝමල ගාන්ධාරය සහ ෂාඩව-සම්පූර්ණ
   (3) කෝමල නිෂාදය සහ ඖඩව-සම්පූර්ණ
   (4) උච්ච කෝමල ගාන්ධාරය සහ සම්පූර්ණ
   (5) උච්ච කෝමල ගාන්ධාරය සහ ෂාඩව (……)


- සංගීත භාණ්ඩවලට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **11** සහ **12** යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

  A - තත් හතරකින් යුක්ත ය.
  B - පර්දා රහිත ය.
  C - අළුවෙන් (Bow) වැයේ.


11. A, B සහ C හි සඳහන් ලක්ෂණ සියල්ලට ම ගැලපෙන සංගීත භාණ්ඩය කුමක් ද?
   (1) සිතාර් (2) තාම්පුරා (3) එස්රාජ් (4) දිල්රුබා (5) වයලින් (……)

12. A සහ B හි සඳහන් ලක්ෂණ දෙකම අඩංගු භාණ්ඩ යුගලයක් සඳහන් වරණය තෝරන්න.
   (1) වයලින් - එස්රාජ්
   (2) එස්රාජ් - තාම්පුරා
   (3) තාම්පුරා - වයලින්
   (4) වයලින් - සිතාර්
   (5) සිතාර් - තාම්පුරා (……)


- අංක **13** සහ **14** යන ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූපසටහන් උපයෝගී කරගන්න.



A



B



C

13. A රූපසටහනෙහි දැක්වෙන සංගීත භාණ්ඩය අයත්, සංගීත පද්ධතිය හා ගායන විශේෂය සඳහන් වරණය තෝරන්න.
   (1) කර්ණාටක සංගීතය - ධෘපද්
   (2) හින්දුස්ථානී සංගීතය - චතුරංග
   (3) කර්ණාටක සංගීතය - වර්ණම්
   (4) හින්දුස්ථානී සංගීතය - වර්ණම්
   (5) කර්ණාටක සංගීතය - ධමාර් (……)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

0088

**14.** A, B සහ C රූපසටහන්වල දක්වා ඇති සංගීත භාණ්ඩ අතුරෙන් හින්දුස්ථානී සංගීතයට අයත් වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි. (......)

**15.** ධමාර් ගීත හා සම්බන්ධ වඩාත් ම උචිත ප්‍රකාශය තෝරන්න.
(1) දෘත ලයෙන් පමණක් ගායනය කිරීම.
(2) අධික ලෙස මූර්කි යොදා ගනිමින් ගායනය කිරීම.
(3) පඛාවාජයට අනුව ගායනය කිරීම.
(4) තානාලංකාර සහිතව ගායනය කිරීම.
(5) චෞතාලයට අනුව ගායනය කිරීම. (......)

**16.** 'ජග්ජිත් සිං' නමැති ඉන්දියානු සංගීතඥයා සුප්‍රකට
(1) ධෘපද් ගායකයෙකි. (2) ඨුම්රි ගායකයෙකි.
(3) ඛ්‍යාල් ගායකයෙකි. (4) ගzසල් ගායකයෙකි.
(5) කව්වාලී ගායකයෙකි. (......)

**17.** ගැල්, පැල්, පතල් හා පාරු ගීත ගායනයේ දී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය කුමක් ද?
(1) ඒකලව හා ආඝාතාත්මකව ගැයීම
(2) සාමූහිකව හා ආඝාතාත්මකව ගැයීම
(3) ඒකලව හා අනාඝාතාත්මකව ගැයීම
(4) සාමූහිකව හා අනාඝාතාත්මකව ගැයීම
(5) යුගලව හා ආඝාතාත්මකව ගැයීම (......)

**18.** ප්‍රශස්ති ගීත විශේෂය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සරස්වතී මණ්ඩපයේ දී ගායනය කිරීම
(2) හින්දුස්ථානී සංගීත භාණ්ඩ යොදා ගැනීම
(3) කෝට්ටේ යුගයේ දී ආරම්භ වී පොළොන්නරු යුගයේ දී ව්‍යාප්ත වීම
(4) කාන්තාවන් පමණක් ගායනය සඳහා සහභාගි වීම
(5) දකුණු ඉන්දීය සංගීතඥයින්ගේ දායකත්වය ලැබීම (......)

**19.** පහතින් දැක්වෙන්නේ ශාන්තිකර්ම ගී පාද තුනකි.
A – සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා
B – එර්දිවෙලා උඩුගුවනෙ වඩින්නේ
C – ගුණ ඇනේ බෝසත් අනේ – පෙර ඉපදුනේ
ඉහත A, B හා C හි සඳහන් ගී පාද ඇතුළත් වන්නේ පිළිවෙළින්,
(1) පහතරට, උඩරට සහ සබරගමු ශාන්තිකර්මවලට ය.
(2) උඩරට, සබරගමු සහ පහතරට ශාන්තිකර්මවලට ය.
(3) උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට ය.
(4) සබරගමු, උඩරට සහ පහතරට ශාන්තිකර්මවලට ය.
(5) පහතරට, සබරගමු සහ උඩරට ශාන්තිකර්මවලට ය. (......)

**20.** සැවුලා වන්නමට අයත් 'බර අත් ගෙන කගින්' යන කවිය ගායනයට සුදුසු තිත කුමක් ද?
(1) සුළු මැදුම් දෙතිත (2) දෙසුළු මැදුම් තුන්තිත
(3) මැදුම් මහ දෙතිත (4) දෙසුළු මහ තුන්තිත
(5) සුළු මහ දෙතිත (......)

**21.** කෝලම් රංග ශෛලියට සම්බන්ධ චරිතයක්, රඟ දැක්වූ ස්ථානයක් සහ ගීතයක් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) පොතේ ගුරු – කරළිය – ගම්භිර කාලිංග නුවර
(2) ජසයා – රඟමඬල – පාට වරුණ පුත
(3) බෙරකරු – කමත – වෙදා නටන්නේ පළමුව
(4) සබ්බිදානේ – තානායම්පොළ – මං ලෙස සොබනා
(5) ආරච්චි – වේදිකාව – පෙර සිට පැවත එන (......)

22. 'නුර්ති' රංග සම්ප්‍රදායේ සාම්ප්‍රදායික ව භාවිත කළ සංගීත භාණ්ඩ යුගලය වන්නේ,
(1) ගැටබෙරය සහ සර්පිනාව ය. (2) පඛාවාජය සහ බටනලාව ය.
(3) මෘදංගය සහ වයලීනය ය. (4) මද්දලය සහ වයලීනය ය.
(5) තබ්ලාව සහ සර්පිනාව ය. (……)

23. 'C - Major' ස්කේලයට අයත් ස්වර සියල්ල ම ඇතුළත් වන Minor ස්කේලය කුමක් ද?
(1) $B^b$ Minor (2) A Minor (3) D Minor
(4) $E^b$ Minor (5) G Minor (……)

24. |නි නි නි | ස ස ස | රි – ස | නි – – |
|නි – නි | ස – ස | රි – රි | ග – – |

ඉහත ස්වර ප්‍රස්තාර කොටස අයත් ස්කේලය (Scale) කුමක් ද?
(1) A Major (2) $B^b$ Major (3) C Major (4) D Major (5) G Major (……)

25. බටහිර සංගීතයට අනුව $\frac{4}{4}$ ටයිම් (time) හැඳින්වීම සඳහා භාවිත කෙරෙන පාරිභාෂික නාමය වන්නේ,
(1) අල්ලා බ්‍රීව් (Alla Breve) ය. (2) ට්‍රිපල් ටයිම් (Triple time) ය.
(3) කොමන් ටයිම් (Common time) ය. (4) සිම්පල් ටයිම් (Simple time) ය.
(5) ඩ්‍යුපල් ටයිම් (Duple time) ය. (……)

26. 
මෙම ස්වර ප්‍රස්තාරයට අයත් 'කෝඩ්' එක (chord) කුමක් ද?
(1) A Major (2) D Major (3) G Major (4) F Major (5) E Major (……)

27. හින්දි චිත්‍රපට ගීතවල තනු යොදාගෙන නිර්මාණය වූ ගීත දෙකක් සඳහන් වරණය තෝරන්න.
(1) 'අන්න සුදෝ අර පාට වළා' සහ 'පෙම්රැල්ල නැගේ'
(2) 'කවේ කිරි සුවඳ' සහ 'ගලන ගඟකි ජීවිතේ'
(3) 'ඕලු නෙලුම් නෙරිය රඟාලා' සහ 'කමලාසනී වන්දනී'
(4) 'කොවුලන් හඬයි' සහ 'සුදු සඳ එළියේ'
(5) 'උන්මාද සිතුවම්' සහ 'ගුමු ගුමුව වදුලේ' (……)

28. කණ්ඩායම් සංගීතයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වනුයේ,
(1) සුසංවාද (Harmony) සහිත ව ගායනය, වාදනය කිරීමයි.
(2) සංධ්වනියක් ආකාරයෙන් සංගීතය නිර්මාණය කර තිබීමයි.
(3) හින්දුස්ථානී රාගාංගවලින් යුක්ත වීමයි.
(4) ආලාප, තානාලංකාර ආදී සුවිශේෂාංග යොදා ගැනීමයි.
(5) සංගීත භාණ්ඩ ලෙස ගිටාරය සහ රබාන පමණක් යොදා ගැනීමයි. (……)

29. සංගීත නිර්මාණය සඳහා හෝ පටිගත කිරීම වැනි කාර්ය සමග හෝ සෘජුව ම සම්බන්ධ **නොවන** මෘදුකාංගය කුමක් ද?
(1) Adobe Audition (2) Nuendo (3) Sound forge
(4) FL Studio (5) Adobe InDesign (……)

30. අප්‍රිකානු සංගීතයට අයත් අවනද්ධ වාද්‍ය භාණ්ඩයක්, ඝන වාද්‍ය භාණ්ඩයක් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) Djembe - Balafon (ජෙම්බෙ - බැලපෝන්)
(2) Kpanlogo - Kora (කැපන්ලොගො - කෝරා)
(3) Balafon - Kora (බැලපෝන් - කෝරා)
(4) Cajon - Conga (කහෝන් - කොන්ගා)
(5) Bongo - Darbuka (බොංගෝ - දර්බුකා) (……)

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** විමල් අබේසුන්දර මහතා විසින් රචිත ඉන්දියානු සංගීතය පිළිබඳව සිද්ධාන්තමය කරුණු ඇතුළත් සංගීත ග්‍රන්ථයේ නම ' ........................................ ' වන අතර, 1974 වසරේ මුද්‍රණය වූ 'ලංකාවේ සංගීත සම්භවය' ග්‍රන්ථය රචනා කරන ලද්දේ ........................................ මහතා විසිනි.

**32.** රිසමග, ගරිපම, .... වශයෙන් ආරෝහණ පිළිවෙළින් යෙදෙන ස්වර අභ්‍යාස රටාවේ, ඊළඟ පියවරට අයත් ස්වර හතර පිළිවෙළින් _ _ _ _ වන අතර, එහි අවරෝහණ රූපයට අනුව යෙදෙන ප්‍රථම පියවරෙහි ස්වර හතර පිළිවෙළින් _ _ _ _ වේ.

**33.** ආරෝහණයේ කෝමල ස්වරයක් ද සහිතව ස්වර 5ක් යෙදෙන, නිර්දේශිත රාගයේ නම ................................ වන අතර, එම රාගයේ අවරෝහණයෙහි යෙදෙන කෝමල ස්වර සංඛ්‍යාව ......... කි.

**34.** නිර්දේශිත රාග අතුරෙන් මේලය, වාදී, සංවාදී සහ ගානසමය යන කරුණු සියල්ල ම සමානව යෙදෙන රාග දෙක වන්නේ ................................ රාගය සහ ................................ රාගය යි.

- අංක **35** සිට **37** තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

අළුවෙන් වැයෙන භාණ්ඩයක තත් තුනක් භාවිතයෙන් පියුමි විසින්

| ගු මම ධ නිධ | සං සං මංගු රිසං | නි ධ ම පධ | ගු ගු මගු රිස |
|---|---|---|---|
| 3 | x | 2 | 0 |

ලෙස වැයූ 'ලෙහෙරාවට' අනුව, උදේනි විසින් මුඛඩාවෙන් ආරම්භ කරන ලද වාදන මාධ්‍යයේ වැයූ 'ගත්' වාදනය තිහායි කොටසකින් අවසන් කරන ලදී.

**35.** උදේනි වැයූ සංගීත භාණ්ඩයේ නම ........................ වන අතර, වැයූ තාලයේ නම ..................... වේ.

**36.** ......................... නම් රාගයෙන් ලෙහෙරාව නිර්මාණය වී ඇති අතර, එම රාගයේ යෙදෙන ආගන්තුක (විවාදි) ස්වරය වන්නේ ......................... ස්වරයයි.

**37.** ලෙහෙරාව වැයූ සංගීත භාණ්ඩයේ නම ..................... වන අතර, එහි ඇති සියලු ම තත් සංඛ්‍යාව ...... කි.

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්න සඳහා ගායන ශෛලියකට අනුව නිර්මාණය කරන ලද පහත ගීතස්වර ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | රිග | ස | රි | – | නි | – | ප | – | නි | ස | රි | ස | – | |
| ස | රස් | ව | තී | S | මා | S | තා | S | සු | න | ලී | ජේ | S | |
| ග | රි | ස | රි | ග | ප | නි | සං | – | නි | ප | ග | රී | – | |
| දී | ම් | ත | න | න | දෙ | රෙ | නා | S | න | දෙ | රෙ | නා | S | |
| සරි | ගප | ගරි, | රිග | පනි | පග, | ගප | නිසං | නිප, | පනි | සංරිං | සංනි | පග | රිස | |
| ගරි | සරි | සනි | සරි | ග, | ගරි | සරි | සනි | සරි | ග, | ගරි | සරි | සනි | සරි | ග |
| තිට | කත | ගදි | ගන | ධා, | තිට | කත | ගදි | ගන | ධා, | තිට | කත | ගදි | ගන | ධා |
| x | | | 2 | | | | 0 | | | 3 | | | | x |

**38.** ඉහත ගීතස්වර ප්‍රස්තාරයට අදාළ ගායන ශෛලියෙහි නම ................................ වන අතර, අදාළ රාගයෙහි නම වන්නේ ................................ ය.

**39.** ප්‍රස්තාරයෙහි, 'සර්ගම්' කොටසින්, තානාලංකාරයක් පිළිඹිබු වෙතැයි සිතුවහොත්, එම තානාලංකාරය ............................ තාන වර්ගයට අයත් වන අතර, 'දීම් තනන- දෙරෙනා' වශයෙන් යෙදී ඇති අක්ෂරවලින් පමණක් ගැයෙන ගායන ශෛලිය ......................... නමින් හැඳින්වේ.

**40.** ප්‍රස්තාරයට අදාළ තාලයෙහි නම ................................ වන අතර, තිට කත ගදි ගන ධා වශයෙන් වූ අවනද්ධාක්ෂර තෙවරක් යෙදීම ................................ නමින් හැඳින්වේ.

[හයවැනි පිටුව බලන්න.

Past Papers Wiki

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**41.** | දොං – දො | ජිං – ග ත | ජි ග ත | දොං – ත ක | බෙර පදය .............................. දෙතිතට අයත් වන අතර, | දොං – | ජිං – ත | ග ත | දොං – ත | බෙර පදය .............................. දෙතිතට අයත් වේ.

**42.** 'තත් ජිත් තොම් තන්' කොටස ඇතුළත් .............................. සවුදම .............................. තිතට අනුව ගැයේ.

**43.**
ස ස ග ම ප ප ප ධ ප නි ධ ප ම ග, _ _ _ _ _
මො හු හැ ර වෙ න, ද න් ऽ ऽ ऽ ऽ ऽ ऽ, ऽ ऽ ऽ ऽ ऽ

.............................. ජාතක කාව්‍යයේ ඇතුළත් ඉහත ගී පාදය, ගායන රිද්මය අනුව .............................. වැලපුම් ගී වර්ගයට අයත් වේ.

**44.** නාඩගම් රංග සම්ප්‍රදායට අයත් ගීත .............................. සංගීතයේ ආභාසයෙන් ද, .............................. රංග සම්ප්‍රදායට අයත් ගීත හින්දුස්ථානී සංගීතයේ ආභාසයෙන් ද නිර්මාණය වී ඇත.

**45.** උඩරට ශාන්තිකර්ම ආභාසයෙන් .............................. රංග සම්ප්‍රදායේ ගීතවල තනු නිර්මාණය වී ඇති අතර කෝලම් රංග සම්ප්‍රදායේ ගීතවල තනු නිර්මාණය වී ඇත්තේ .............................. ශාන්තිකර්ම ආභාසයෙනි.

**46.** 'දිං තං තං, ගති තග තං' යනු, .............................. නම් අවනද්ධ භාණ්ඩයෙන් වයනු ලබන තාල පදයක් වන අතර, එය භාවිත වනුයේ .............................. රංග සම්ප්‍රදාය සඳහා ය.

**47.** .............................. සූරීන් විසින් ගයනු ලබන 'හෝපලු වන පෙත' ගීතය .............................. රාගය ආශ්‍රිත ව නිර්මාණය වී ඇත.

**48.**
| ග ප ප | ග ප - | ම ධ ධ | ම ධ - |
| නි නි ප | නි නි රි | සං - - | - - - |

ඉහත ස්වර ප්‍රස්තාර කොටසට ගැලපෙන ලෙස කෝඩ්ස් (chords) වාදනය කිරීමේ දී C, ......... සහ ......... යන කෝඩ්ස් (chords) තුන ප්‍රමාණවත් ලෙස යොදා ගත හැකි ය.

**49.** සඩ්ජයේ සංඛ්‍යාතය හර්ට්ස් 256 ක් නම් මධ්‍ය සප්තකයේ මධ්‍යම ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් ............ ක් සහ ධෛවත ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් .................... ක් වේ.

**50.** කරුණාරත්න කිරිවත්තුඩුව සූරීන් .............................. නමැති තත් වාද්‍ය භාණ්ඩ වාදනයට සුප්‍රසිද්ධ වන අතර, එම භාණ්ඩ වාදනයට සුප්‍රසිද්ධ ඉන්දියානු සංගීත ශිල්පියකු වනුයේ පණ්ඩිත් .............................. සූරීන් ය.

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | |
|---|---|
| පෙරදිග සංගීතය | II |
| கீழைத்தேய சங்கீதம் | II |
| Oriental Music | II |

54 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් විශේෂ ලක්ෂණ කිහිපයකි.

A - නිෂාදය දෙආකාරයෙන් ම යෙදෙන මෙම රාගයේ ආරෝහණයේ දී ගාන්ධාරය හා ධෛවතය දුර්වලය. 'මගරිගස' යන ස්වර සංගතිය යෙදේ.

B - ඖඩව-සම්පූර්ණ ජාති රාගයක් වන මෙම රාගයේ 'මපධ, මපග, රිමප' යන ස්වර සංගතිය යෙදේ.

C - උදය සන්ධි ප්‍රකාශ රාගයක් වන මෙම රාගයේ රිෂභය හා ධෛවතය ආන්දෝලනය වේ. 'මගමරිස' යන ස්වර සංගතිය යෙදේ.

(i) ඉහත රාග තුන හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත රාග අතුරෙන් **එක්** රාගයකට අදාළ මධ්‍යලය 'ඛ්‍යාල්' ගීතයක හෝ ගත් වාදිතයක හෝ ස්ථායි කොටස, තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා **අටකට** නොඅඩු තානාලංකාර **දෙකක්** ද තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඉහත (ii) කොටසට තෝරා **නොගත්** රාග අතුරෙන් **එක්** රාගයකට සමප්‍රකෘති වන නිර්දේශිත රාගය නම් කර, එම සමප්‍රකෘති රාග දෙක අතර සමානතා **දෙකක්** සහ අසමානතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

(iv) ඉහත (ii) සහ (iii) කොටස්වලට තෝරා **නොගත්** රාගයට අදාළ විශේෂ ස්වර සංගති **තුනක්** ලියා දක්වන්න. (ඉහත A, B සහ C හි සඳහන් ස්වර සංගති යොදා **නොගන්න**.) (ලකුණු 03 යි.)

**2.** නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩ තුනක් පහත දැක්වේ.

A - රිගමප, මග, රිගුරිස

B - ගරිනි̣ප̣, ප̣නි̣ සගරිස

C - මගුරිස නි̣ධ̣ ධ̣නි̣සම

(i) ඉහත A, B සහ C මගින් නිරූපණය වන රාග තුන හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) පහත දැක්වෙන කොටස් අතුරෙන් **එක්** කොටසකට අදාළ ව නිර්මාණයක් කර, ස්වර ප්‍රස්තාර කරන්න.

(a) A ස්වර ඛණ්ඩයෙන් දැක්වෙන රාගයට අදාළ ස්වර සංගති යොදා ගනිමින්, 'ජප්' තාලයේ ආවර්ත **දෙකකට** අනුව, සර්ගම් වාදිතයකට සුදුසු ස්වර නිර්මාණයක්.

**හෝ**

(b) B ස්වර ඛණ්ඩයෙන් දැක්වෙන රාගයට අදාළ ස්වර සංගති යොදා ගනිමින්, 'පංජාබ්' තාලයේ ආවර්ත **දෙකකට** අනුව, සරල ශාස්ත්‍රීය වාදනයකට සුදුසු ස්වර නිර්මාණයක්.

**හෝ**

[දෙවැනි පිටුව බලන්න.

(c) C ස්වර ඛණ්ඩයෙන් දැක්වෙන රාගයට අදාළ ස්වර සංගති යොදා ගනිමින්, ඒක් තාලයේ ආවර්ත **දෙකකට** අනුව, විලම්බලය වාදිතයකට සුදුසු ස්වර නිර්මාණයක්. (ලකුණු 07 යි.)

(iii) ඉහත (ii) හි ඔබ නිර්මාණය කළ සංගීතාංගයට අදාළ තාලය, තාල සංඥා දක්වමින් සම, දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iv) A, B සහ C ස්වර ඛණ්ඩවලින් පිළිබිඹු වන රාග අතුරෙන් ඉහත (ii) කොටසට ඔබ තෝරා **නොගත්** රාගයකට අදාළ මධ්‍යලය ගීතයක හෝ ගත් වාදිතයක හෝ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

**3.** පහත දැක්වෙනුයේ, රාගධාරී සංගීතය සඳහා යොදා ගනු ලබන සංගීත භාණ්ඩ පහකට අදාළ තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| ප්‍රසිද්ධ වාදන ශිල්පීන් | සුවිශේෂී කොටස් | ප්‍රධාන තත්/සිදුරු සංඛ්‍යා | හඬ උපදවන ආකාර/ උපකරණ | භාණ්ඩයන්හි නම් |
|---|---|---|---|---|
| පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා | ජිද | සිදුරු - 07 | මුඛයෙන් | __A__ |
| විශාරද වී. හේමපාල පෙරේරා | Possition marks | තත් - 06 | plectrum (පික්) | __B__ |
| පණ්ඩිත් නිඛිල් බෙනර්ජී | මංකා | තත් - 07 | __C__ | __D__ |
| පණ්ඩිත් අශිෂ්චන්ද්‍ර බෙනර්ජී | චමරා | තත් - 04 | __E__ | __F__ |
| විශාරද බී. වික්ටර් පෙරේරා | Sound post | __G__ | Bow (අළුව) | __H__ |

(i) වගුවෙහි A සිට H තෙක් හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 04 යි.)

(ii) වගුවෙහි තොරතුරුවලින් පිළිබිඹු වන සංගීත භාණ්ඩ පහෙන් **එක්** සංගීත භාණ්ඩයක දළ රූපසටහනක් ඇඳ එහි කොටස් **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) තබ්ලා වාදනයක ඇතුළත් 'කායදා', 'පල්ටා', 'මුඛඩා' පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි.)

(iv) ගායනයක් හෝ වාදනයක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමේ දී මින්ඩ්, ගමක් සහ මූර්කි ස්වරාලංකාර භාවිතයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

## II කොටස

**4.** ශ්‍රී ලංකාවේ ගැමි ගී අතුරෙන් බොහොමයක් 'මෙහෙ ගී' ගණයෙහි ලා සැලකෙන අතර, උච්ච ස්වරයෙන් ගැයීම හා ආඝාතාත්මකව මෙන්ම අනාඝාතාත්මකව ගැයීම ද විශේෂත්වයකි.

(i) 'මෙහෙ ගී' බොහොමයක් වෘත්තීයමය ස්වභාවයන් සමග මනාව බද්ධ වී ඇති අයුරු නෙලුම් ගී හා ගොයම් ගීවල නාද රටා සහ රිද්මය ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 06 යි.)

(ii) ගැමි ගී උච්ච ස්වරයෙන් හා අනාඝාතාත්මකව ගායනය කිරීමට හේතු 'පතල් ගී සහ බඹර ගී' ඇසුරෙන් විමසන්න. (ලකුණු 06 යි.)

(iii) 'කෙතක මහිම' නමින් විනාඩි 4 ක පමණ කාලයකට ගැළපෙන නිර්මාණාත්මක සංගීතාංගයක් ගොඩනැගීම සඳහා යොදාගත හැකි 'මෙහෙ ගී' **හතරක්** නිදසුන් වශයෙන් ගෙන, නිර්මාණ අවස්ථා සමග ඒවා සම්බන්ධ කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**5.** (i) මහනුවර යුගයේ රාජසභාවට අයත් සංගීත හා නැටුම් ආයතන **දෙකක්** මගින් සිදු වූ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(ii) මහනුවර යුගයේ දී ශ්‍රී ලංකාවේ සංගීත විකාශය කෙරෙහි කර්ණාටක සංගීතයේ බලපෑම 'වන්නම්' සහ 'ප්‍රශස්ති' ඇසුරෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(iii) 'භාෂා ශෛලිය, නාද රටා, රිද්මය සහ තාල ලක්ෂණයන්හි සුසංයෝගී සම්බන්ධතාවය, හටන් ගීවලට සුවිශේෂී වූ ගති ලක්ෂණයකි.' මෙම අදහස නිදර්ශනාත්මක ව සනාථ කරන්න. (ලකුණු 08 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



## III කොටස

**6.** පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්තාර කොටස ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.



(i) ඉහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(ii) ස්වර ප්‍රස්තාරයට අදාළ ගීතය අයත් තාලයට සමාන හින්දුස්ථානි තාලය නම් කර, ස්කේලය ද (Scale) සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(iii) ඉහත ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන්නේ 70 දශකයේදී ශ්‍රී ලංකා ගුවන්විදුලියේ ජනප්‍රිය වූ ගීත විශේෂයකට අයත් ගීතයක කොටසකි. එම ගීත විශේෂයේ පුරෝගාමීන්, සංගීත කණ්ඩායම්, භාවිත කළ සංගීත භාණ්ඩ, ජනප්‍රිය වූ ගීත පිළිබඳ කරුණු ඇතුළත් කර කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) පහත සඳහන් ස්වර පාදය අනුගමනය කරමින් සරල ගීතයකට සුදුසු ස්වර රචනාවක් සංවර්ධනය කර ස්වර ප්‍රස්තාර කරන්න. (දී ඇති ස්වර පාදයට අමතරව තවත් ස්වර පාද **තුනක්** ප්‍රමාණවත් ය.)

| ස – ගප | ධ – නිධ | නි – – ධ | ප – මග | (ලකුණු 06 යි.)

**7.** 'ශ්‍රී ලාංකේය සමාජය තුළ රාගධාරී සංගීත රසාස්වාදය වර්ධනය සඳහා, හින්දි චිත්‍රපට ගීත මෙන්ම මෙරට සරල ශාස්ත්‍රීය ගීත ද, මහත් පිටිවහලක් වී ඇත'.

(i) රාගධාරී පදනමකින් සංගීත නිර්මාණය වූ හින්දි චිත්‍රපට ගීත **දෙකක** ගායකයා හෝ ගායිකාව, චිත්‍රපටයේ නම සහ ගීත නිර්මාණයට පදනම් වූ රාගය ඇතුළත් කෙටි වගුවක් පිළියෙල කරන්න. (ලකුණු 04 යි.)

(ii) සරල ශාස්ත්‍රීය පදනමක් සහිත රාගධාරී අංග ඇතුළත් මෙරට සරල ගීත **තුනක** ගායකයා හෝ ගායිකාව, සංගීත නිර්මාණකරුවා, සහ ගීත නිර්මාණයට ආශ්‍රය කරගත් රාගය ඇතුළත් කෙටි වගුවක් පිළියෙල කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඔබ විසින් තෝරාගත් ගීතයක් තුළ ඇතුළත් රාගාශ්‍රිත ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(iv) සත් සමුදුර චිත්‍රපටයේ තේමා ගීතයේ (සිනිඳු සුදු මුතු තලාවේ) පද මාලාවෙන් ප්‍රකාශිත අදහස තීව්‍ර කරලීමට සංගීතය, නාද මාලාව සහ රිද්මය යොදාගෙන ඇති ආකාරය නිදර්ශනාත්මකව අගයන්න. (ලකුණු 07 යි.)

**8.** පහත සඳහන් කොටස් අතුරෙන් **හතරක්** තෝරා පිළිතුරු සපයන්න.

(i) සංධ්වනියක (Symphony) ඇතුළත් විශේෂ ලක්ෂණ **පහක්** ලියා දක්වන්න.

(ii) සරල ගීතයක යෙදෙන Bits, Counter Points, Introduction, Interlude සහ Adlibs පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.


(iii) ශ්‍රී ලංකාවේ ජන සංගීත ක්ෂේත්‍රයේ උන්නතියට ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා විසින් රචිත 'හෙළ ගී මග' ග්‍රන්ථයෙන් ලද දායකත්වය කරුණු **පහක්** යටතේ අගයන්න.

(iv) උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකෙහි සමානතා **දෙකක්** සහ අසමානතා **තුනක්** සඳහන් කරන්න.


(v) සංගීත චිකිත්සකයෙකු විසින් විශේෂයෙන් වර්ධනය කරගත යුතු ගුණාංග **පහක්** ලියන්න.

(ලකුණු 05 × 4 = 20 යි.)

* * *



වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න
LOL
Book Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්
ORDER BOOKS FROM LOL BOOKS STORE
0372060110
WWW.LOL.LK
071 777 4440 (WhatsApp)
Cash On Delivery Available


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls
WITH LOL BOOK STORE!